www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ නව ආන්ඩුව ඇමරිකාවේ "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය" වෙනුවෙන් ඉදිරිපත් වෙයි

## Sri Lanka's new government signs up for US "war on terrorism"

**කේ. රත්නායක විසිනි**
**2004 ජූනි 09**

---

අප්‍රේල් 2 දා පැවති මැතිවරනයෙන් ශ්‍රී ලංකාවේ බලයට පැමිනි එක්සත් ජනතා නිදහස් සන්ධානය (එජනිස) ඇමරිකාවේ ඉරාක ආක්‍රමනය පිලිබඳව සිය සීමිත වූ විවේචනයන් ඉවත දමා, ''ත්‍රස්තවාදයට එරෙහිව යුද්ධය" ට සහයෝගය දීමේ නාමයෙන් බුෂ් පරිපාලනය වෙත සිය පූර්න සහාය පලකොට තිබේ.

විදේශ ඇමති ලක්ෂ්මන් කදිරගාමර් වෙලඳ, ආයෝජන සහ ආරක්ෂාව ඇතුලු කාරනා ගනනාවක් පිලිබඳව ජ්‍යෙෂ්ඨ ඇමරිකානු නිලධාරීන් සමග සාකච්ඡා මාලාවක් සඳහා මැයි මස මැද භාගයේ දී වොෂින්ටනයේ සිව් දින සංචාරයක යෙදුනේ ය. සංචාරය සිදු වූයේ ඉරාකය තුල ඇමරිකානු විරෝධී ජනතා නැගිටීම් සහ එ.ජ. විසින් ඉරාක රැඳවියන් ක්‍රමානුකූලව වධබන්ධනයට ලක් කිරීම පිලිබඳව එලිදරව් වීම් මධ්‍යයේ වුව ද කදිරගාමර් ඇමරිකානු පිලිවෙත පිලිබඳව විවේචනයෙන් වැලකී සිටියේ ය.

ඒ වෙනුවට බෲක්ලින්ස් ආයතනයේ දී කතා කරමින් කදිරගාමර් බුෂ් පරිපාලනය සඳහා වන සිය සහයෝගය පිදී ය. ''සැප්තැම්බර් 11දාට බොහෝ පෙර සිට ශ්‍රී ලංකාව ත්‍රස්තවාදයේ ගොදුරක් විය. දැන් එය ලොව පුරා පැතුරුන ප්‍රපංචයකි. ත්‍රස්තවාදී ප්‍රචන්ඩත්වය නිසා ඇතිව තිබෙන ඔබේ සන්තාපය අපි බෙදා ගන්නෙමු. ඇමරිකාව අගය කරන්නන් ලොව පුරාම සිටිති. අපි ඉදිරියේ දී ද ඇමරිකාවේ තිරසාර මිතුරෝ වෙමු''ය යි ඔහු පැවසීය.

එ.ජ. ''ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය''ට පිටුබලය දීම වෙනුවෙන් කොලඹ දේශපාලන සංස්ථාපිතය විසින් ''ත්‍රස්තවාදීන්'' ලෙස හැඳින්වීම පුරුද්දක් කර ගෙන සිටින එල්ටීටීඊය සමග ගනුදෙනුවේ දී එ.ජ. සහාය අපේක්ෂා කරයි. එල්ටීටීඊය සමග ඇනහිට පවතින සාකච්ඡා යලි ආරම්භ කරන ලෙසට වොෂිංටනය ශ්‍රී ලංකා ආන්ඩුවට බල කරමින් සිටී. ආන්ඩුව සාකච්ඡා සඳහා තමන්ගේ කොන්දේසි මත එල්ටීටීඊය ගෙන ඒමට බල කිරීමට බුෂ් පරිපාලනයේ සහයෝගය ලබා ගැනීමට මාන බලයි.

කදිරගාමර්ගේ ප්‍රකාශන ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග සහ ඇගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) පැත්තෙන් සිදු වූ දැවැන්ත වෙනසක් පිලිබිඹු නොකරයි. මෙයට පෙර ඇගේ පාලන සහාගය වූ පොදු පෙරමුන (පො.පෙ.) ඇමරිකාව විසින් ඇෆ්ඝනිස්ථානයේ තලේබාන් පාලනය පෙරලා දැමීමට සිය පූර්න සහාය පල කලේ ය. එය අඩ සියවසකටත් වැඩි කාලයකට පසුව උප මහාද්වීපයට එල්ල වූ පලමු අධිරාජ්‍යවාදී මිලිටරි මැදිහත් වීම ය. එ.ජ. මිලිටරියට ගුවන් සහ වරාය පහසුකම් සැලසීමට තමන්ගේ සූදානම පො.පෙ ආන්ඩුව ප්‍රකාශයට පත් කලේ ය.

ඉරාක ආක්‍රමනය අවස්ථාවේ පො.පෙ බලයෙන් පහවී ගොස් තිබුනි. පාලක එක්සත් ජාතික පෙරමුනු ආන්ඩුව යුද්ධය සඳහා සිය සහයෝගය ප්‍රකාශ කර සිටියේ ය. පසු ගිය සැප්තැම්බරයේ එක්සත් ජාතීන් හමුවේ කතා කල අගමැති රනිල් වික්‍රමසිංහ ආන්ඩුවේ ආකල්පය සම්පින්ඩනය කර දැක් වී ය. ඔහු ඇමරිකාව ඉරාකයේ ආක්‍රමනික ග්‍රහනය යුක්ති සහගත කලේ, ''එක්සත් ජාතීන්ගේ අසාර්ථකත්වය'' ඇමරිකාවට ''ලෝක පොලිස්කාරයකු'' ලෙස ''මැදිහත් වනවා හැර'' වෙන කරන්නට දෙයක් නැති තත්වයක් නිර්මානය කලේ යැයි එක්සත් ජාතීන්ට දෝෂාරෝපනය කරමින් ය. කුමාරතුංග වත් ඇගේ වාම සගයින් වත් (ලංකා සමසමාජ පක්ෂය - ලසසප - සහ ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය) එ.ජ. මෙහෙය වූ ආක්‍රමනය, එය යුක්ති සහගත කිරීමට පැවසූ මුසාවාද හෝ මෙම ඛනිජ තෙලින් සරු රට නීති විරෝධීව නව යටත් විජිතයක් අල්ලා ගැනීම හෙලා දුටුවේ නැත. යුද විරෝධී ව්‍යාපාරය ගසා කනු වස් කුමාරතුංග යම් සීමාවන් සහිත දුක ප්‍රකාශ කල අතර වික්‍රමසිංහව විවේචනය ද කලා ය. සමහර ශ්‍රීලනිප සාමාජිකයෝ යුද විරෝධී ව්‍යාපාරයටද සම්බන්ධ වූහ.

කෙසේ වෙතත් කුමාරතුංගගේ ස්ථාවරය ඕනෑම ආක්‍රමනයක් සඳහා එක්සත් ජාතීන්ගේ අනුමැතිය ලැබිය යුතු ය යන ප්‍රන්සයේ හා ජර්මනියේ ඉල්ලීම්වලට සහයෝගය දැක්වීමට සීමා විය. පසු ගිය පෙබරවාරියේ ක්වාලාලම්පූරයේ නොබැඳි ජාතීන්ගේ සමුලුවේ කතා කරමින් ඇය මෙසේ ප්‍රකාශ කලා ය: ''ශ්‍රී ලංකාවේ ස්ථාවරය වනුයේ එක්සත් ජාතීන්ගේ නිල අනුමැතියකින් තොරව ස්වෛරී රාජ්‍යයක් තුලට මැදිහත් නො වීම ය.'' ඇයගේ කතාව තුල දී එ.ජ. හෝ ඉරාකය තුල ඔවුන්ගේ සැලසුම් ගැන හෝ සඳහන් කිරීමට පවා ඇය අසමත් වූවා ය. දැන් යලි බලයට පත්ව සිටින කුමාරතුංග මෙම කෙඳිරීම් පවා අතහැර දමා සිටී.

කෙසේ වෙතත් වඩාත් වැදගත් කාරනය නම් එජනිස තුල ශ්‍රීලනිපයේ ප්‍රධාන පාර්ශ්වකරුවා වන ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) ආන්ඩුවේ ස්ථාවරය පිලිබඳව හෝ එය එ.ජ. සමග මිලිටරි සහයෝගය ශක්තිමත් කර ගැනීම පිලිබඳ හෝ කිසිදු විරෝධයක් මතුකර නොතිබීම ය. 1960 ගනන්වල

දී ජවිපෙ පිහිටුවූයේ සිංහල ස්වෝත්තමවාදය සහ කැස්ත්‍රෝවාදයේ මිශ්‍රනයක පදනම මත වන අතර දැනුදු වරින්වර ''අධිරාජ්‍ය විරෝධී'' රඟපෑම්වල යෙදෙන අතර මාධ්‍ය තුලින් මොවුන් බොහෝවිට ''මාක්ස්වාදී'' න් ලෙස වැරදියට හඳුන්වා දේ.

ඇමරිකානු ආක්‍රමනය සමයේදී ජවිපෙ යුද්ධයට සිය විරෝධය ප්‍රකාශ කල අතර ප්‍රන්සය සහ ජර්මනිය සාමයේ ප්‍රමුඛයන් ලෙස හුවා දැක් වී ය. එහෙත් සටන හමාර බව බුෂ් ප්‍රකාශයට පත් කිරීමත් ප්‍රන්සය සහ ජර්මනිය ඉරාකයේ ඇමරිකානු ආක්‍රමනකාරී ග්‍රහනයට අනුමැතිය පල කිරීමත් සමගම ජවිපෙ විරෝධය ද මැකී ගියේ ය.

දැන් ශ්‍රීලනිප සමග ධනේශ්වර ආන්ඩුවක හවුල්කරුවන් වන ජවිපෙය දේශපාලන සංස්ථාපිතය තුල තමන්ගේ ස්ථානය තහවුරු කර ගැනීමට මාන බලයි. ඔවුන්ගේ යුද විරෝධී පුරසාරම් විශේෂිත අවස්ථාවලට සීමා වූ වාචාල කතා බවට පත්ව තිබේ. මෙවර මැයි දින රැලියේ ජවිපෙ යෝජනාවන්ගෙන් එකක් විදේශ හමුදා ඉරාකයෙන් ''පිට වීම'' ඉල්ලා තිබුන නමුත් එජනිස ආන්ඩුව එවැනි පිලිවෙතක් මත පිහිටා ක්‍රියා කල යුතු යයි බලකිරීමේ කිසිදු අදහසක් ඔවුන්ට නොමැත.

## ඇමරිකා - ශ්‍රී ලංකා මිලිටරි සබඳතා

එජනිස කලාපය තුල ඇමරිකානු මිලිටරි මෙහෙයුම්වලට වචනයෙන් පමනක් නොව ක්‍රියාවෙන් ද සහයෝගය දෙයි. මැද පෙරදිග සහ මධ්‍යම ආසියාවේ වැඩෙන ඇමරිකානු මැදිහත්වීම් සඳහා කොන්දේසි සකසා දීමේ දී වොෂින්ටනය සමග එහි මිලිටරි සබඳතාවයන් ශක්තිමත් කර ලීමට නව ආන්ඩුව ගෙනයන වැඩ කටයුතුවලින් තල්ලුවක් ලබා දෙයි. ශ්‍රී ලංකාව ඉන්දීය සාගරයේ වැදගත් මුහුදු මාර්ගයන් අසල මූලෝපායිකව පිහිටා තිබෙන අතර මැද පෙරදිග මධ්‍යම ආසියාවේ හා ඉදිරියේ දී දකුනු ආසියාවේ ඇමරිකානු මිලිටරි මෙහෙයුම් සඳහා සුවපහසු සැපයුම් මධ්‍යස්ථානයක් වෙයි.

කදිරගාමර්ගේ සංචාරයේ දී ඇමරිකාවේ නියෝජ්‍ය රාජ්‍ය ලේකම් රිචඩ් ආමිටේජ් ප්‍රවෘත්ති සාකච්ඡාවකදී ඇමරිකානු මූලෝපායෙහි ශ්‍රීලංකාවේ වර්ධනය වන වැදගත් කම පිලිබඳව ඇඟවුම් කලේ ය.

''ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය සම්බන්ධිතව ඇමරිකාවට ශ්‍රී ලංකාවේ සහයෝගය දෙනු ලැබී ය.'' යනුවෙන් වැඩිපුර විස්තර නොමැතිව ඔහු පැවසී ය.

ඇමරිකා යුද නැව් සහ ගුවන්යානා සඳහා ඉන්ධන සැපයීමේ සහ අනෙකුත් සේවාවන් සඳහා ශ්‍රී ලංකාවෙන් පහසුකම් ලබා ගැනීමේ ප්‍රවිශ්ඨවීමේ සහ අන්‍යොන්‍ය සේවාවන් සැපයීමේ ගිවිසුමක් (ඒසීඑස්ඒ) සඳහා ඒ වන විටත් එජාපෙ ආන්ඩුව ඇමරිකාව සමග සාකච්ඡා අරඹා තිබුනි. කලාපයේ පුලුල්ව පැතිරුන ඇමරිකානු සැපයුම් ජාලයක් සැකසීම සඳහා වන සැලැස්මේ කොටසක් ලෙස එවැනි ගිවිසුමක් ඇති කර ගැනීමට එජනිසයේ මනාපය පිලිබඳව කදිරගාමර් වොෂින්ටනයේ සිටි කාලයේ දී ඇඟවුම් කර තිබුනි.

මැයි 23 *සන්ඩේ අයිලන්ඩ්* උපුටා දැක්වූ ඇමරිකානු තානාපති කාර්යාල ප්‍රකාශකයෙකු ඒසීඑස්ඒය සඳහා නව ආන්ඩුව ඉක්මනින්ම පියවර ගනු ඇතැයි වොෂින්ටනය බලාපොරොත්තු පල කලේ ය. ගිවිසුම ''පැමිනෙන ගුවන්යානා සහ නැව්වලට ඉන්ධන සැපයීමේ පහසුකම් සැලසීමට වඩා වැඩි දෙයක්'' බව පැහැදිලි කල ඔහු පැවසුවේ, ''එම පහසුකම් දැන් පවා අපට තිබේ'' යනුවෙනි.

ඇමරිකාව කොයිතරම් දේ ඉල්ලා සිටිනවා ද යන්න 2002 දී පිලිපීනය විසින් අත්සන් තැබුනු මේ හා සමාන ගිවිසුමකින් පෙන්නුම් කරයි. මිලිටරි මෙහෙයුම් සහ කාර්ය සංවිධාන සහ සහයෝගතා ගිවිසුමෙන් ඇමරිකානු මිලිටරියට, නවාතැන් පහසුකම්, සන්නිවේදනය සහ වෛද්‍ය පහසුකම් ඇතුලු පලල් සැපයුම් සහ ගබඩා පහසුකම් සලසා දෙයි.

එජනිසය ඉරාකයට හමුදා යැවීමට ආසන්න තත්වයක නොසිටිය ද ශ්‍රී ලංකාව දැනට ''සාම සාධක හමුදා'' සඳහා ඇමරිකානු අනුග්‍රහය ලැබෙන පුහුනු අභ්‍යාසයන් පවත්වමින් සිටී. පලමු වතාවට බංග්ලාදේශ, නේපාල සහ මොංගෝලියානු හමුදා දිවයිනේ දකුනේ රහසිගත ස්ථානයක බහු බන්ධ අභ්‍යාසයක (එම්ඩීඑන්) යෙදී සිටී. මෙය සිදු කැරෙන්නේ දකුනු ආසියා සාම සාධක ආරම්භකත්වයේ අධීක්ෂනය යටතේ ය.

''අවුරුදු දෙක තුනක් යනතෙක් මූලිකව අපට අවශ්‍යවන්නේ සාමසාධක කටයුතුවලට සම්බන්ධවීමට පමනි. පසුව අපට සාමය බලගැන්වීමේ කටයුතුවල යෙදීමට පුලුවන.'' යනුවෙන් මෑතක පල වූ *ජේන්ස් ඩිෆෙන්ස් වීක්ලි* සඟරාවට ලංකාවේ හමුදා නායක ජෙනරාල් ලයනල් බලගල්ල ප්‍රකාශ කලේ ය. සාම සාධනයේ මුවාවෙන් කෙරෙන මේ සියලු ප්‍රකාශවලින් ඇඟවෙන්නේ ලෝක ගෝලය පුරා එ.ජ. ක්‍රියාවට නගන රටවල් ගිලගන්නා මිලිටරි මෙහෙයුම්වලට සහය දීමට ශ්‍රී ලංකාව සූදානම්වෙමින් සිටින බවයි.

විශේෂ කාර්ය බලකායන් පුහුනු කිරීම ඇතුලුව ශ්‍රී ලංකා හමුදාව සමග සබඳතාවයේ දීර්ඝ ඉතිහාසයක් ඇමරිකාව සතුව තිබේ. එහෙත් ඉහත වර්ධනයන් අඟවන්නේ එජනිසය ඇමරිකාව සමග වඩා සමීප මිලිටරි සබඳතා ගොඩ නගමින් සිටින බව ය. ඇමරිකාවේ සිටිය දී කදිරගාමර් ඇමරිකානු නාවික හමුදාව ලංකාවට විකිනීමට යන 'කරේජස්' නම් වෙරළාරක්ෂක නව්කාව පරීක්ෂා කලේ ය. මැයි මාසයේ දී තායිලන්තයේ පැවැත්වූ ''කෝබ්‍රා ගෝල්ඩ්'' නම් ඇමරිකාවේ අනුග්‍රහයෙන් පැවැත්වූ ඒකාබද්ධ යුද අභ්‍යාසය නිරීක්ෂනය කිරීමට ද පෙන්ටගනය ශ්‍රී ලංකා මිලිටරියට ආරාධනය කලේ ය.

ශ්‍රී ලංකාව එක එල්ලේ ම ඉරාකය තම අනසකට යටත් කිරීමේ පිලිවෙතට විරුද්ධත්වය දැක්වුව හොත්, හා සියලු විදේශ හමුදා වහාම කොන්දේසි විරහිතව ඉවත් කරන ලෙස ඉල්ලා සිටිය හොත් මේ සියල්ලම කරගත නොහැකිවනු ඇත. කුමාරතුංග, ශ්‍රීලනිපය සහ ජේවීපීය මෙලෙස කටයුතු නොකරනු ඇත.

© www.wsws.org